Weekly school Department of Education, Sabaragamuwa Province/ Weekly school Department of Education, Sabaragamuwa Province/ Weekly school Department of Education, Sabaragamuwa Province/ Weekly school Department of Education, Sabaragamuwa Province/ Weekly school Department of Education, Sabaragamuwa Province/ Weekly school Department of Education, Sabaragamuwa Province/ Weekly school Department of Education, Sabaragamuwa Province/

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - පෙරදිග සංගීතය

සතිය - 12 වන සතිය

ශ්‍රේණිය - 07

සැකසුම - අවලා දිසානායක මිය
ර/බළ/ආනන්ද මෛත්‍රෙය මධ්‍ය මහා විද්‍යාලය

## පාඩම :- කෝලම් ගීත ගායනය සමඟ රංගනය කිරීම.

➢ කෝලම් නාට්‍ය යනු,

- ශ්‍රී ලංකාවේ පහත රට හෙවත් දකුණු ප්‍රදේශවල ප්‍රචලිතව පැවැති ගැමි නාටක විශේෂයකි.
- මෙම නාට්‍ය වෙස් මුහුණු පැළඳ රඟ දක්වන ලදි.
- ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය ලෙස පහත රට බෙරය භාවිතා කරයි.
- විනෝදාස්වාදය මෙන්ම සමාජයේ දුර්වල තැන් උපහාසයට ලක් කරමින් නාට්‍ය නිර්මාණය කර ඇත. පිරිමින් විසින් චරිත රඟපෑම ද විශේෂයි.
- නාට්‍යවල වෙස් මුහුණු නොපළඳින්නේ පොතේගුරු හා අත්වැල් ගායකයින් පමණි.
- කෝලම් නාටක සඳහා
  - ලෙන්චිනා කෝලම
  - ජස කෝලම
  - පොලිස් කෝලම
  - මුදලි කෝලම
  - ආරච්චි කෝලම නිදසුන්වේ.

**<u>කෝලම් චරිත</u>**




**<u>කෝලම් ගීත</u>**

➢ පොතේගුරු

පෙර සිට පැවත එන
සිරිතට පොදිය බැඳගෙන
උරපිට තබා ගෙන
යෝධ ජසයා ඒය දුවගෙන

➢ ජසයා

ගම්හිර කාලිංග නුවර නිරිඳුගෙ වාසල පුරයට
ඉන්න දනා සේම රජුට සෝදා පට පිළි සොඳට
ඉන් නරනා තැබූ නම මට ඬේ විදානෙ සත්තට
මං මෙතනට ආමි වියන් බඳිනට නරනිඳු එවිට

➢ ලෙන්චිනා

මං වගෙ පේඩි කතක් මනා - දුටුවාද ලොවේ රුසියෙන් දිනා
මං කළ පෙර පවකින් ගෙනා - මට හිමි වුණේ මහලු වූ වෙසමුණා

මවුපියො නිදහස් වෙන්නටා - මාව දුන්නයි නාකි වූ හමෙකුටා
උන්දලා හට කඹුරන්නටා - යැද ඉන්නේ සුරන් හට දොස් කොටා

**මං වගෙ පේඩි කතක් - ගීත ස්වර ප්‍රස්තාරය**
**(මැදුම් මහ දෙතිත)**

| | | | |
|---|---|---|---|
| ^ | / | ^ | / |
| ප නි - | නි - නි - | ධ - - | ප - ධ - |
| ම ං S | වා S ගෙ S | පේ S S | ඩී S ක S |
| ම' ම' - | ප - ධ - | - - - | ධ - ධ - |
| ත ක් S | ම S නා S | S S S | දු S ටු S |
| ම' - - | ම - ම - | ප - - | ධ - ධ - |
| වා S S | ද S ලො S | වේ S S | රු S සි S |
| ප + + | ධ නි ධ - | ප - - | ප - ධ - |
| S + + | රෙ න් දි S | නා S S | දු S ටු S |
| ම' - - | ම - ම - | ප - - | ධ - ධ - |
| වා S S | ද S ලො S | වේ S S | රු S සි S |
| ප + + | ධ නි ධ - | ප - - | - - - - |
| S + + | රෙ න් දි S | නා S S | S S S S |

*(කවිවල ඉතිරි පද ගැයෙන්නේ ද ඉහත ප්‍රස්තාරය අනුව ම ය)*

<u>පැවරුම</u>

01. පහත වගුව සම්පූර්ණ කරන්න.

| කෝලම් නිර්වචනය කරන්න | ප්‍රචලිත ප්‍රදේශ නම් කරන්න | නාට්‍ය වල සුවිශේෂී ලක්ෂණ | භාවිත කළ සංගීත භාණ්ඩ | කෝලම් චරිත |
|---|---|---|---|---|
| | | | | |

02. කෝලම් නාට්‍ය සහිත වීඩියෝ පට සොයා නරඹන්න.

03. කෝලම් නාට්‍ය හා බැඳී පවතින ගැමි කතා පුවත් සොයා කියවන්න.